# ආර්ථිකයේ සිටි උපාධිධාරීන් 16,000 නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට

■ අමිත් මධුරංග

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට පසුගිය රජය යටතේ අනුයුක්ත කර සිටි උපාධිධාරීන් 16,000 දෙනා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට අනුයුක්ත කළ බව බුද්ධශාසන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ජේ. දඩල්ලගේ මහතා ප්‍රකාශ කළේය.

ආර්ථික සංවර්ධන නිලධාරීන් ලෙස වසම් බාරව කටයුතු කළ එම උපාධිධාරීන් පිරිසට සමාන්තර රාජකාරි පැවරීමට වැඩපිළිවෙළක් හඳුන්වාදීමට කටයුතු කරගෙන යන බවත්, ග්‍රාමීය සංවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලබාගැනීම රජයේ අපේක්ෂාව බවත්, ලේකම්වරයා සඳහන් කළේය.

මෙතෙක් කලක් විවිධ දුෂ්කරතා මධ්‍යයේ සේවය කළ එම පිරිසට මින් ඉදිරියට අභිමානවත් ලෙස රාජකාරි කිරීමට හැකි වාතාවරණයක් නිර්මාණය කරන බවද ඔහු පැවසීය.

මේ පිළිබඳව ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ නිලධාරීන් පිරිසක් සමග රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේදී ඊයේ (12දා) විශේෂ සාකච්ඡාවක්ද පැවති අතර ඊ සඳහා එම සංගමයේ ලේකම් අජිත් ජයසුන්දර මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

වසර 03ක් තිස්සේ රාජකාරියක් නොමැතිව සේවය කළ මෙම උපාධිධාරීන්ට සුදුසු රාජකාරි ලැයිස්තුවක් සකසා දැනට සේවය කරන වසම්වල රාජකාරි කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසයි මෙහිදී ජයසුන්දර මහතා ඉල්ලා සිටියේය.

පසුව 'අද' පුවත්පතට අදහස් දැක්වූ අජිත් ජයසුන්දර මහතා සඳහන් කළේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ගෙන ඇති තීරණයෙහි කිසිදු විනිවිදභාවයක් නොමැති බවයි.

පසුගිය රජය සමයේ වසර 03ක් තිස්සේ මේ පිළිබඳව පැහැදිලි කිරීම් සිදුකළද විසඳුමක් නොලැබුණු බව කී හෙතෙම රජය කටයුතු කරන ආකාරය පිළිබඳව විමසිල්ලෙන් යුතුව බලාසිටින බවද පවසා සිටියේය.